"කවදාවත් දන්නේ නැති කොල්ලෙක් තුරුලට බලන්න ඕනේ දුවගෙන ගිහින් වැටුණු හැටි...... අපට කියන්නේ නම් මුකුත් මතක නෑ කියලා..... හැබැයි අරයා දැක්ක ගමන්, 'නි.....ශ්.....ක......' කියලා බලන්න එපැයි කෑගහපු හැටි...."

දිනූෂ, තම දෑස් කෙස් අතරින් යවා, හිස තදකොට අල්වාගනු රිදීමා දුටුවාය. එම සිද්ධිය ඔහු මෙතරම් වේදනාවක් ගෙනදේ යැයි ඈ කිසිවිටකත් නොසිතුවාය. නිශ්ක වෙත ඇය දිවගියේ සිතා මතා නොවේ. එය සිදුවූයේ ඉබේටමය. එහෙත් ඔහුගේ උණුසුම, තමාට සුපුරුදු නිවහනක් ලෙසින් ඇයට කිසිවිටකත් නොදැනුණේය. ඔහු කෙරෙහි ඇය තුළ වූයේ, දැවී ගිය ගොඩනැගිල්ලක නටබුන් දකින්නකු තුළ ඇතිවන අනුකම්පා-වකට සමානවූ, තේරුම් ගත නොහැකි, තේරුම් කළ නොහැකි අනුකම්පාවකි.

"මොකද මචං !"
අජය, දිනූෂගෙන් විමසුවේ රහසිනි. දිනූෂ ඊට පිළිතුරු නුදුන්නේය. වචන පිටකර ගත නොහැකි තරමේ ආවේගයක්, තමා තුළ තෙරපෙනු ඔහුට දැනුණි. එය පුපුරා හැලීමට ආසන්න ගිණි කන්දක් වැනි විය.

"එයාගෙන් ඒවා අහලා වැඩක් නෑ අජය...... ඒක අහන්න ඕන මෙන්න මෙයාගෙන් !"

මහීකා ඔවුන්ගේ කතාව මැදට පැන්නාය.
"පොඩ්ඩක් කට පියාගෙන ඉන්න මහී...." ඒ අමාය.
"අනෙක් අයට පොඩ්ඩක් හුස්ම ගන්නවත් දෙන්න......."

"මටත් හුස්ම ගන්න බැරිකොට මම කොහොමද අනික් අයට හුස්ම ගන්න ඉඩදෙන්නේ ?"
මහීකා තරහෙන්ම කතා කළාය.
ඇය මෙතරම් නපුරු උණේ කෙසේදැයි රිදීමා කල්පනා කළාය.
"පොඩ්ඩක් ඉවසන්න මගේ පැටියෝ......" අජය පැවසීය.
"විහිළු කරන්නෙපා මගෙත් එක්ක. මම තරහෙන් ඉන්නේ !"

"ඒක නම් අපි හැමෝටම පේනවා." රුචිරා පැවසුවාය.
"ඔයාලට තේරෙන්නේ නැති දෙයක් තමයි, රිදීමා මේ වෙලාවේ මොන මානසික මට්ටමකින් ඉන්නවද කියන එක...." අමා, විස්තර කිරීමට තැනුවාය.

"ඔය කතා හොඳයි දොස්තරලට. මම දොස්තර කෙනෙක් නෙමි...." මහීකාගේ හඬ තවමත් මුරණ්ඩු වූයේය.
"අපි හිතුවට වඩා මේක බරපතළ ප්‍රශ්ණයක් ! කෑ ගහලා විසඳන්න පුළුවන් දෙයක් නෙමි....." අමා යළිත් කීවාය.
"බෝතල් දෙකක් විතර බොන්න ඕන ප්‍රශ්ණයක්....." අජය පැවසුවේය.

"අජය........" අමා ඔහු නිහඬ කළාය.
"අපට පේන්නේ රිදීමා රඟපෑමක් කරනවා කියලා...... ඇත්තටම කිව්වොත් එයත් දන්නේ නැහැ, මොනවද කරන්නේ කියලා. ඔයාට තේරෙන්නේ නැද්ද මහීකා එයාට, එයාගේ අතීතේ එක්තරා කොටසක් ගැන කිසිම අවබෝධයක් නැති බව. එයාගේ ඔළුවෙන් කියන දේ එයා ක්‍රියාවට නගන්නේ...."

මහීකා ගැස්සුවාය. ඉතා අසරණ බවක් දැනුණෙන්, රිදීමා දෑතින් මූණ වසා ගත්තාය. ඇගේ සැලෙන දෙඋරින් පෙනුණේ, ඇය තමාගේ හැඬුම වලකා ගැනීමට තැත්දරන බවකි.

"එයාට බනින්න එපා මහීකා... එයා ඒ හිතලා කරපු දේවල් නෙමේනේ." බලා සිටීමට බැරි තැන දිනූෂ පැවසුවේය. ඔහුගේ බිඳුණු හඬ ඇසුණු රිදීමා ඉකිබින්දාය.

දිනූෂ සිතුවේ මෙතනින් පලායාමටය.

රිදීමා නොපෙනෙන දුරකට පලායාමටය. තමා තවදුරටත් මෙහි උන්නොත් කොයි මොහොතක හෝ හඬා වැටෙතැයි ඔහු බිය වූයේය.
"මම යනවා....." ඔහු යාන්ත්‍රිකව උන්තැනින් නැගිට්ටේය.
රිදීමාගේ අසුන අසලින් යද්දී ඔහුට දැනුණේ, තමාගේ පය පැටලෙන බවකි.

"රිදීමා...." ඔහු ආයාසයෙන් පැවසුවේය.
"හොඳ ළමයාවගේ නාඩා ඉන්න....." ඔහු ඇගේ හිසෙයි තම සුරත මොහොතකට තැබීය.

"දිනූෂ..... දිනූෂ...."
ඔහු වහා වැටෙන්නට ගිය රිදීමා වත්තන් කර ගත්තේය.
"මට සමාවෙන්න දිනූෂ....." රිදීමා හැඬුවාය.

"මට නිශ්කව මතක නැහැ. මට නිශ්කව පොඩ්ඩක්වත් මතක නැහැ....."
සියල්ලෝම, දිනූෂ වැළඳගෙන හඬන රිදීමා දෙස විමතියෙන් බලා සිටියෝය.

මතු සම්බන්ධයි




# මුරලි ඔබට ආයුබෝවන්

මම මෙරට පැමිණි මුල් අවදියේ දී, එක්තරා දවසක දුම්රියේදී මෙරැටියෙකු හා සුහද කතාවක යෙදුනෙමි. ඔහු මා කොයි රටේදැයි විමසූ විට මම ශ්‍රී ලංකාවෙන් යැයි පිළිතුරු දුන්නෙමි. නමුත් මාගේ පුදුමයට ඔහු ලංකාව ගැන කිසිවක් දැන නොසිටියේය. ඔහුට ලංකාව පිළිබඳ විස්තරත්, ලෝක සිතියමේ ලංකාවේ පිහිටීමත් විස්තර කිරීමට මම උත්සහ කළෙමි. හදිසියේම ඔහුට යමක් සිහිපත් විය. අරවින්ද සහ මුරලි ක්‍රිකට් ගසන්නේ ලංකාවේ නේදැයි ඔහු මගෙන් විමසීය. රටක් වශයෙන් ශ්‍රී ලංකාව ගැන නොදැන සිටි ඔහු ලංකාව ගැන යන්තම් හෝ අසා තිබෙන්නේ මේ පුංචි මිනිසුන් දෙදෙනා නිසා නේදැයි මට එවේලේ සිතුණි.

1972 උපත ලැබූ මුත්තයියා මුරලිදරන් ලෝක ක්‍රිකට් ඉතිහාසයේ නොමැකෙන සටහනක් තැබූ ශ්‍රී ලංකික පුත්‍රයෙකු බවට පසුගිය දා අභිශේක ලැබීය. ඒ ලෝක ක්‍රිකට් ඉතිහාසයේ ටෙස්ට් කඩුලු 800 ලබාගත් ප්‍රථම සහ සමහර විට අවසාන ක්‍රිකට් ක්‍රීඩකයා බවට පත්වීමෙනි. මෙම ලිපියෙහි මුලින්ම මේ නිහතමානී දැවැන්තයාට ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික අප සැමගේ ගෞරව ප්‍රනාමය පුද කරනු කැමැත්තෙමි.



මුරලිගේ හැකියාවන් අප බොහෝ විට අසා ඇත. නමුත් ඊට අමතර වූ බොහෝ ආදර්ශ අපට මෙන්ම අපේ තරුණ පරපුරටද ලබා ගැනීමට මේ පුංචි මිනිසා අපට මග පෙන්වා ඇත. කිසිම අභියෝගයක් හමුවේ නොසැලෙන අධිෂ්ඨාන ශක්තිය මුරලි තුළ තිබූ ප්‍රධාන ගුණාංගයකි. විශේෂයෙන් ඕස්ට්‍රේලියානු ක්‍රීඩකයින් සහ මාධ්‍යය ඔහුව මානසිකව බිම දැමීමට නොගත් උත්සහයක් නැත. ඔහු මෙරට සංචාරය කළ හැම විටකම ඔහුට නොයෙක් චෝදනා කරමින් ඔහු මානසිකව අඩපන කිරීමට බොහෝ උත්සාහ දැරූ බව අපි දනිමු. ඒ හැම අවස්ථාවකදීම තම හැකියාවන් තවත් ඉහළ මට්ටමකට ගෙන යෑමට මුරලිට හැකියාව ලැබුණි. ඒ අභියෝගවලදී ඔහු නොබියව ඒ සියල්ලටම මුහුණ දීමට නිහතමානීව ඉදිරිපත් විය. ඒ හැම අවස්ථාවකදීම නියම ශ්‍රී ලාංකිකයෙකු ලෙස තම අධිෂ්ඨානය හා කැපවීම ලොවට පෙන්වීමට මුරලිට හැකියාව ලැබුණි.

පල බර අතු බිමට නැමෙන්නා සේ මුරලි ද බොහෝ නිහතමානී පුද්ගලයෙකු විය. ලෝකයේ ඉහලම පන්දු යවන්නා වූ ඔහු හැමවිටම පොලවේ පයගසා සිටි ඉතා නිරහංකාර පුද්ගලයෙකු වීම ඔහුගෙන් අපට ගතහැකි තවත් ආදර්ශයකි. ඔහු කිසිවිටෙකවත් මාධ්‍ය තුළ හෝ කිසිම ස්ථානයක ඔහු ගැන පුරසාරම් දෙඩීමට ඉදිරිපත් වූයේ නැත. ක්‍රීඩා පිටිය තුල ද ඔහු නිශ්ශබ්ද නිහතමානී සාමාන්‍ය ක්‍රීඩකයෙකු විය. ඔහු කෙතරම් ප්‍රවීණයකු වුවත් නායකත්වයට අභියෝග කිරීමට හෝ නායකත්වය විවේචනය කිරීමට උත්සහ දරා නැත. ඒ නියම ක්‍රීඩකයෙකුගේ මෙන්ම නියම මිනිසෙකුගේ උදාර ගති ලක්‍ෂණයකි.

ශ්‍රී ලාංකික සමාජය තුල ඇති ජාතික සමගියට ද මුරලි ඉතා වැදගත් නිදසුනකි. පසුගිය කාලයේ පැවති නොයෙකුත් ජාතිවාදී අරගල මැද පවා මුරලි ශ්‍රී ලංකා කණ්ඩායමටත්, ශ්‍රී ලංකා කණ්ඩායම මුරලිටත් දැක්වූ සහයෝගය ගෞරවයත් ඉතා වැදගත් සාධකයකි. සියළුම ක්‍රීඩාලෝලීන් පවා කිසිම බේදයකින් තොරව මුරලිට ගෞරව කිරීම, සමගිය අගයන ශ්‍රී ලංකාව පිළිබඳ ලොවට දැක්වූ හොඳ නිදසුනකි. එමෙන්ම සුනාමි ව්‍යසනය අවස්ථාවේදී දකුණේ සිංහලයින් වෙනුවෙ-න් මුරලි දැක්වූ සහයෝගය පහුගිය උදාරතර මනුෂ්‍යත්වයට එක් වැදගත් නිදසුනකි.

මෙවනි උදාරතර ක්‍රීඩකයෙකුගේ සමුගැනීම අතිශයින්ම අප රටට අභාග්‍යකි. ඔහුගේ අවසාන තරගය නැරඹූ මට සිතුනේ ඔහු තවත් වසර ගණනාවක් ක්‍රීඩා කල යුතුව තිබූ බවකි. ටෙස්ට් ඉතිහාසයේ 67 වැනි වතාවටත් ටෙස්ට් කඩුලු 5 බිඳ හෙලූ එකම ක්‍රීඩකයා ඔහු වීමටත් මුරලිට අවසාන තරගයේ හැකියාව ලැබුනි. බලෙන් හෝ කන්ඩායමේ රැඳී සිටීමට උත්සහ දරන බො-හෝ ක්‍රීඩකයන් සිටින අප රටේ මුරලිගේ ඉවත්වීමද විශේෂ ආදර්ශයකි. වරක් ෂේන් වොන් ද පැවසූ පරිදී කඩුලු 1000ක ඉලක්කයට යාමට මුරලිට බො-හෝ අවස්ථාව තිබුනි. එහෙත් නියම කාලයේ වීරයෙකු ලෙස සමුගැනීම මුරලිගේ නිහතමානීත්වයට හොඳම නිදසුනකි.

සියලු දේ ඉතා ඉක්මනින් අමතක වන ශ්‍රී ලාංකික අපට මේ අසම සම ක්‍රීඩකයාද කාලයත් සමඟම අමතකවනු නිසැකය. ආදරණීය ක්‍රීඩකයානෙනි, ඔබ අපේ පුංචි මව් බිම ක්‍රිකට් ලොව තුල මහද්වීපයක් කළේය. තරුණ ක්‍රීඩකයන්ට මහඟු අත්වැලක් විය. කිසිදා විඳිය නොහැකි දැවැන්ත වාර්තා බිහිකරමින් ක්‍රිකට් යෝදයින් අතර ලිලිපුට්ටෙක් විය. ඉතින් ඔහුගේ නාමය ශ්‍රී ලාංකික ක්‍රීඩා ඉතිහාසය තුල අමරණීය නාමයක් වේවායි ආදරයෙ-න් ප්‍රාර්ථනා කරමි.

මුරලි ඉතින් ඔබට ආයුබෝවන්.

අශාන් කුමාරගේ

